ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

සන්නිවේදන දෙපාර්තමේන්තුව
30, ජනාධිපති මාවත, කොළඹ 01, ශ්‍රී ලංකාව
දුරකථන අංක: 2477424, 2477423, 2477311
ෆැක්ස්: 2346257, 2477739
ඊ-මේල්: dcommunications@cbsl.lk, communications@cbsl.lk
වෙබ් අඩවිය: www.cbsl.gov.lk

# පුවත්පත් නිවේදනය

| නිකුත් කළේ | ව්‍යවහාර මුදල් දෙපාර්තමේන්තුව |
| --- | --- |
| දිනය | 2019.03.25 |

**මහජනතාවට කාසි නිකුත් කිරීම සඳහා කවුළුවක් විවෘත කිරීම**

ශ්‍රී ලංකා මහ බැංකුව මහජනතාව වෙනුවෙන් කාසි නිකුත් කිරීමේ කවුළුවක් කොළඹ 1, ජනාධිපති මාවතේ අංක 30 දරන ශ්‍රී ලංකා මහ බැංකු මූලස්ථානයේ බිම් මහලේ දී මාර්තු 27 වන බදාදා සිට විවෘත කරනු ලැබේ.

රජයේ සහ බැංකු නිවාඩු දිනවල හැර සෑම සතියකම බදාදා සහ බ්‍රහස්පතින්දා දිනවලදී පමණක් පෙ.ව.9.00 සිට පෙ.ව.11.00 දක්වා මෙම කවුළුව මහජනයාට ගනුදෙනු සඳහා විවෘත වනු ඇත.

එක් අයෙක් සඳහා එක් වරකට නිකුත් කරන අවම කාසි ප්‍රමාණය එක් මුහුණත වටිනාකමකින් කාසි 100 ක පැකට් 1ක් වන අතර රුපියල, රුපියල් 2, රුපියල් 5 සහ රුපියල් 10 යන ඕනෑම මුහුණත වටිනාකමකින් කාසි 100 බැගින් වන පැකට්, රු.20,000/- ක උපරිම වටිනාකමකට යටත්ව මෙම කවුළුවෙන් ලබාගත හැකිය.

කාසි තොග වශයෙන් ලබා ගැනීමට අවශ්‍ය පුද්ගලයන්ට/ ආයතනවලට සිය කාසි අවශ්‍යතාවන් පිළිබඳව ශ්‍රී ලංකා මහ බැංකුවේ, ව්‍යවහාර මුදල් දෙපාර්තමේන්තුවේ අධිකාරි වෙත ඉල්ලුම් පත්‍රයක් රාජකාරි දින දෙකකට පෙර යොමු කිරීමෙන් කාසි ලබා ගැනීමේ පහසුකම් සලසා ඇත.

අදාල ඉල්ලුම් පත්‍රය හා උපදෙස් පත්‍රිකාව ශ්‍රී ලංකා මහ බැංකුවේ ව්‍යවහාර මුදල් දෙපාර්තමේන්තුවේ මුදල් කවුළුවෙන් හෝ ශ්‍රී ලංකා මහ බැංකුවේ නිල වෙබ් අඩවියෙන් ලබා ගත හැක (www.cbsl.gov.lk).

වැඩි විස්තර සඳහා;

ශ්‍රී ලංකා මහ බැංකුව : දුරකථන අංකය : 0112477371/ 0112477130
විද්‍යුත් තැපැල : currency@cbsl.lk

අධිකාරි
ව්‍යවහාර මුදල් දෙපාර්තමේන්තුව
ශ්‍රී ලංකා මහ බැංකුව
නො. 30, ජනාධිපති මාවත
කොළඹ 01
ශ්‍රී ලංකාව.